# <u>ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ස්වයංරැකියා වෙනුවෙන් ආධාර සැපයීම</u>
# <u>උපදෙස් මාලාව - 2026</u>

## හැදින්වීම:-

ශ්‍රී ලංකාවේ ජනගහනය සීඝ්‍රයෙන් වියපත් වෙමින් සිටී. මෙම වියපත් වන ජනගහනය ආර්ථික වශයෙන් සවිබලගැන්වීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව වියපත්වන මෙම ජනගහනය සතු ස්වයං නිර්මාණශීලි හැකියාවන් හා අත්දැකීම් පදනම් කර ගනිමින් ඔවුන්ව ආර්ථික වශයෙන් සවිබලගැන්වීම, රටේ ආර්ථිකයට සවියක් වන වැඩිහිටි ප්‍රජාවක් නිර්මාණය කිරීම හා ඔවුන්ව දළ දේශිය නිෂ්පාදිතයේ කොටස් කරුවන් ලෙස දිරි ගැන්වීම මෙම වැඩසටහනේ අපේක්ෂිත අරමුණ වේ. ඒ අනුව දිවයින පුරා විසිරී සිටින වයස අවුරුදු 60 ට වැඩි නිර්මාණශීලිත්වයෙන් හෙබි හා ස්වයංව සිය ජීවන රටාව ඉදිරියටත් ගෙන යා හැකි යැයි හඳුනාගන්නා වැඩිහිටියන් සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ හිමිවේ .

ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සිදු කරන අතර,දැනට ස්වයංරැකියාවක නිරතවන කණ්ඩායම් හෝ තනි පුද්ගලයන් සඳහා (කණ්ඩායමකට රුපියල් 250,000.00 ක් හා තනි පුද්ගලයකුට රුපියල් 50,000.00 ක උපරිමයකට යටත්ව) අවශ්‍ය උපකරණ, යන්ත්‍ර සුත්‍ර, ඉදිකිරීම් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වැනි ප්‍රාග්ධන ස්වරූපයේ යෙදවුම් ලබාදෙනු ලබයි.

## <u>ක්‍රියාත්මක ක්‍රමවේදය</u>

1. අදාල ස්වයංරැකියාව සම්බන්ධව වර්තමාන තත්ත්වය හා අනාගත ඉලක්ක ඇතුලත් ව්‍යාපෘති වාර්තාවක් (ඇමුණුම 01) ඉදිරිපත් කළ යුතුය. එය විදිමත් වියදම් ඇස්තමේන්තුවක් සහිත ව්‍යාපෘති වාර්තාවක් විය යුතුය .

2. අදාල ස්වයංරැකියාව සිදු කරගෙන යැමේදී ඊට සුදුසු තාක්ෂණික නිලධාරීන්ගේ සහය ලබා ගතයුතු ය.

3. අදාල ප්‍රතිලාභීන් සඳහා ඍජුව මුදල් ආධාර ලබා නොදිය යුතු අතර. නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර අවශ්‍ය උපකරණ/ ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කළ යුතුය.

4. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු සම්පූර්ණ 60වු අඩුආදායම්ලාභීන් විය යුතුය (අඩු ආදායම්ලාභින් ලෙස සහතික කළ යුත්තේ අස්වැසුම වැඩසටහනේ භාවිතා කරනු ලබන නිර්ණායක මත වේ.)

5. දැනට ස්වයංරැකියාවක් සිදු කරන්නේ නම් එය වැඩිදියුණු කර ගැනීම සඳහා වන ඉල්ලීම් වලට ප්‍රමුඛස්ථානය ලබාදීම යෝග්‍ය වන අතර නව ස්වයංරැකියා ,ව්‍යාපෘති ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිලාභීන්ට ද ස්වයංරැකියාවේ ස්වභාවය, සාර්ථකත්වය හා හැකියාව මත අයදුම් කළ හැකිය.

6. ස්වයංරැකියා සඳහා ඉල්ලුම් ඉදිරිපත් කරන විට කණ්ඩායමක් සඳහා උපරිම රුපියල් 250,000.00 ක් ද, තනි පුද්ගලයෙකු සඳහා උපරිම රුපියල් 50,000.00 ලබා දිය හැකිය. ( කණ්ඩායමේ අවම සමාජිකයන් 05 ක් විය යුතු අතර, අදාල සාමාජිකයින්ගේද තොරතුරු හැඳුනුම්පතේ සහතික කරන පිටපත් සහිතව ඉදිරිපත් කළ යුතුය.)

7. ඇස්තමේන්තුගත මුදල ඉක්මවන විට ඉතිරි මුදල් සපයාගන්නා ආකාරය පිළිබඳ විස්තරය ඉල්ලුම් කරන ප්‍රතිලාභියා විසින් සඳහන් කළ යුතුය. (එම ලේඛනය විෂයභාර නිලධාරී විසින් ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුකර සහතික කළ යුතුය)

8. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත හෝ වැඩිහිටි හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.

9. ස්වයංරැකියාලාභීන් හඳුනා ගැනීම වැඩිහිට හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරි (වැඩිහිටි ) / සමාජ සේවා නිලධාරි / සංවර්ධන නිලධාරි (සමාජ සේවා ) විසින් සිදුකළ යුතු අතර අදාළ ඉල්ලුම් පත්‍රය ග්‍රාමසේවා නිලධාරිගේ හා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

10. වගාවන් ආශ්‍රිත ස්වයං රැකියා සිදු කරගෙන යෑම.(උදා - කහ/ඉඟුරු/කොච්චි/බිම්මල් ආදි වගාවන්). කහ වගාව වැනි කෙටි කාලීන වගාවන් සඳහා පර්චස් 05 ක් හෝ ඊට වැඩි භූමි ප්‍රමාණයක් තිබීම අනිවාර්යය වන අතර, ප්‍රාග්ධනමය උපකරණ හා අවශ්‍ය යන්ත්‍ර ලබා ගැනීම සඳහා ආධාර ලබා දීම සිදු කළ යුතුය. (එම ඉඩම බදු ගෙන වගා කරන්නේනම් ඉඩම් අයිතිකරු විසින් බදු ගන්නා තැනැත්තා වෙත ලබා දෙන ගිවිසුමක් ඉදිරිපත් කළ යුතුය.)

11. වෙළෙඳපොළ වටිනාකමක් / ඉල්ලුමක් සහිත වර්තමානයේ අපෙන් ගිලිහී යන ඉපැරණි සම්ප්‍රදායික කර්මාන්ත ( වට්ටි,පැදුරු වීවීම, පන් අශ්‍රිත නිෂ්පාදන, බීරළු කර්මාන්තය) වලට අදාල අවශ්‍ය උපකරණ / මෙවලම් අදිය මිලදී ගැනීම සඳහා

12. ස්වයංරැකියාවක් ලෙස සිල්ලර වෙළඳාම සිදු කරනු ලබන්නේ නම්, වෙළඳකුටි ඉදිකිරීම, අවශ්‍ය උපකරණ/යන්ත්‍ර මිලදී ගැනීම සඳහා පමණක් ආධාර ලබාදීම සිදුකළ යුතුය. ( විකුණුම් භාණ්ඩ ලබා ගත නොහැක.)

13. දැනට සිදු කරගෙන යන ස්වයංරැකියා සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ ආදිය මිලදී ගැනීම සඳහා ආධාර ලබාදීම සිදුකළ හැකි අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාණ්ඩ වත්තෝරු ලේඛනයට ඇතුලත් කළ යුතුය.

14. ආදිය මිලදී ගැනීම සඳහාදේශීය ලේකම් කාර්යාලයේ වට්ටෝරු ලේඛනයට එම භාණ්ඩ ප්‍රා , .ඇතුලත් කළ යුතුය

15. තනි පුද්ගලයෙකුට ලබා දෙන ස්වයං රැකියා ආධාරයක් සම්බන්ධයෙන් වන විටදී, එම ස්වයං රැකියාව සිදු කිරීම අවසන් කරන අවස්ථාවේදී, ලබා ගත් උපකරණ අදාල ස්වයං රැකියාවක් සිදු කරන වෙනත් අයෙකුට ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත ලබා දීම සිදු කල යුතු අතර ඒ සම්බන්ධව උපකරණ ලබා ගන්නා ස්වයං රැකියා ලාබියා සමග ගිවිසුම් ගත විය යුතුය.

**<u>පසු විපරම්</u>**

01 එක් ප්‍රතිලාභියෙකු හෝ කණ්ඩායමක් සඳහා රුපියල් 50,000.00 ක මුලා ප්‍රතිපාදන සඳහා එක් වතාවක් පමණක් ගෙවීම් කල යුතුය.

02 අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරි (වැඩිහිටි) / සමාජ සේවා නිලධාරි/ සංවර්ධන නිලධාරි ( සමාජ සේවා) විසින් මුදල් භාරගැනීමේ කුවිතාන්සිය (172 පොදු ) හා ප්‍රතිලාභීන් වෙත මුදල් ලබාදුන් බවට සහතික කරන වාර්තාව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත යොමුකළ යුතුය.

03 අදාල ප්‍රතිලාභින්ගේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි / සංවර්ධන නිලධාරි ( වැඩිහිටි ) / සමාජ සේවා නිලධාරි / සංවර්ධන නිලධාරි (සමාජ සේවා ) විසින් මාස 03 කට වරක් ත්‍රෛමාසික වාර්තාව (ඇමුණුම - 02) සම්පූර්ණ කොට එවීම අනිවාර්ය වේ.

04 එමෙන්ම ත්‍රෛමාසික වාර්තාව සම්පූර්ණ කොට එව්මේ දී එම ස්වයංරැකියාවට අදාල ඡායාරූප ඇමිණීම අනිවාර්ය වේ.

05 පසුවිපරම් කටයුතු වලදී අදාල ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය පිළිබඳ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලීය නිලධාරීන් විසින් පසුවිපරම් කටයුතු සිදුකරනු ලබයි.